**ශීර්ෂය - 010 අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව**

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

ශීර්ෂය - 010 අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 21 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අධිකාරයට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 අගෝස්තු 23 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී.  මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත  ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත්  කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

**(අ) වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කොමිෂන් සභාව විසින් වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කර තිබූ රු.43,200 ක් වූ ආදායම් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම යටතේ දක්වා නොතිබූ අතර එය හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම ලෙස දක්වා තිබුණි. එම නිසා එම වටිනාකමින් වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කර තිබූ ආදායම අඩුවෙන්ද හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම වැඩියෙන්ද දක්වා තිබුණි. | වෙන්දේසියෙන් ලද ආදායම වන රු.98,080ක මුදල වෙන්දේසි කරන ලද සියල්ල භෞතික වත්කම් මෙන්ම ආයෝජන ක්‍රියාකාරකම් මගින් ජනිත වූ ආදායමක් ලෙස සලකා , භෞතික වත්කම් විකිණීමෙන් ලද ආදායම යටතේ දක්වා ඇත. තවද මෙමගින් මුදල් ප්‍රවාහයට කිසිදු බලපෑමක් සිදු නොවේ. | වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කළ ආදායම් නිවැරදි ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දැක්විය යුතු වීම. |

**(ආ) ආදායම් නොවන ලැබීම්**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| කොමිෂන් සභාවේ අත්තිකාරම් අය කර ගැනීම් රු.42,010,361 ක් වුවත් එය මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ රු.39,782,951 ක් ලෙස රු.2,227,410 ක් අඩුවෙන් දක්වා තිබුණි. | අත්තිකාරම් අය කර ගැනීම යටතේ අත්තිකාරම් බී ගිණුමේ හරස් සටහන් අදාල කරගෙන නොමැති අතර මුදල් ගනුදෙනු තොරතුරු පමණක් ඇතුලත් කර ඇත. කෙසේ වෙතත් එය මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අවසාන ශේෂයට බලපෑමක් නොමැති අතර ඉදිරි වර්ෂ වලදී මුදල් ප්‍රවාහ ප්‍රකාශය සඳහා එම හරස් සටහන් ඇතුලත් කිරීමට කටයුතු කරමි. | අත්තිකාරම් අය කර ගැනීම් නිවැරදි ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දැක්විය යුතු වීම. |

**(ඇ) මූලධන වියදම්**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2023 නොවැම්බර් 30 දිනැති අංක 05/2023 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ ඇතුළත් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ ආකෘතිය අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් සඳහා මුදල් වැය කිරීම් යටතේ මූලධන වියදම දැක්විය යුතු වුවත් කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කර තිබූ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එය භෞතික වත්කම් ඉදිකිරීම හෝ මිලදී ගැනීම හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් ලෙස දක්වා තිබුණි. ඒ හේතුවෙන් කොමිෂන් සභාවේ සමාලෝචිත වර්ෂයේ මූලධන වියදම් රු.66,676,518 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් ලෙස දක්වා තිබුණි. | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම, හැකියා වර්ධන, වෙනත් මූලධන යන වැය විෂයන්වල වියදම පුද්ගල පඩි නඩි හා මෙහෙයුම් වියදම් යටතේ දැක්වීම නිසා මෙම වැඩිවීම සිදු වී ඇත. භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම හා වෙනත් ආයෝජන යටතේ 2102, 2103 වැය ශීර්ෂ පමණක් ඇතුලත් කිරීම හේතුවෙන් එම අඩුවීම සිදු වී ඇත. | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ ඇතුළත් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ ආකෘතිය අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් සඳහා මුදල් වැය කිරීම් යටතේ මූලධන වියදම දැක්විය යුතු වීම. |

**(ඈ) අත්තිකාරම් ගෙවීම්**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| කොමිෂන් සභාවේ අත්තිකාරම් ගෙවීම් රු.39,170,875 ක් වුවත් එය මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ රු.36,950,987 ක් ලෙස රු.2,219,888 ක් අඩුවෙන් දක්වා තිබුණි. | අත්තිකාරම් අය කර ගැනීම යටතේ අත්තිකාරම් බී ගිණුමේ හරස් සටහන් අදාල කරගෙන නොමැති අතර මුදල් ගනුදෙනු තොරතුරු පමණක් ඇතුලත් කර ඇත. කෙසේ වෙතත් එය මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අවසාන ශේෂයට බලපෑමක් නොමැති අතර ඉදිරි වර්ෂ වලදී මුදල් ප්‍රවාහ ප්‍රකාශය සඳහා එම හරස් සටහන් ඇතුලත් කිරීමට කටයුතු කරමි. | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ අනුව හරස් සටහන්ද ඇතුළත් කළ යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (i) | 2023 නොවැම්බර් 07 දිනැති රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ, රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 03/2023 දරණ චක්‍රලේඛය ප්‍රකාරව රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම පිළියෙල කර නොතිබුණි. | 03/2023 රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශය අනුව සිදු කල යුතු සංශෝධන ඉදිරියේදී රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් බි ගිණුම පිළියෙල කිරීමේදී ඇතුලත් කිරිමට කටයුතු කරනු ලැබේ. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තු වේ, රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අනුව පිළියෙල කළ යුතු වීම |
| (ii) | 2023 අගෝස්තු 02 දින සිට රාජකාරි සඳහා වාර්තා කර නොමැති නිලධාරියකුගෙන් රු.172,500 ක ණය ශේෂයක් විගණිත දිනය වන විටත් අයවිය යුතුව තිබුණි. | සේවය හැර ගොස් ඇති කෝසල මංචනායක මයා වෙත වරින් වර ලිපි මඟින් දැනුවත් කර තිබුණද මේවන විටත් ගෙවීම් කර නොමැති බැවින් ඔහුගේ ඇපකරුගෙන් අය කර ගැනීම සඳහා එම ඇපකරුගේ සේවා ස්ථානයට ලිපි මඟින් දන්වා යවා ඇත. | ණය ශේෂ කඩිනමින් අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

## 2.2 අල්ලස් වැටලීම්වල අල්ලස් වශයෙන් පරිහරණය කිරීම සඳහා අත්තිකාරම් ගිණුම් සැසඳුම් ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | අධිකරණමය කටයුතු වලින් පසු නඩු තීන්දුව ලැබීමෙන් අනතුරුව හෝ අභියාචනා අවසන් වීමෙන් අනතුරුව එම ගොනු වලට අදාලව නඩු භාණ්ඩ නිලධාරියාගේ භාණ්ඩ ශේෂය තුල පවතින භාණ්ඩ පොත්වලින් ඉවත්කළ යුතු වුවත් නඩු තීන්දුව ලබා දී වර්ෂ ගණනාවක් ගතවුවද නඩු භාණ්ඩ අයිතම් 04 ක් නිලධාරියා භාරයේ පැවතුණි. | කටයුතු සිදුකෙරෙමින් පවතී. | අධිකරණමය කටයුතු වලින් පසු නඩු තීන්දුව ලැබීමෙන් අනතුරුව හෝ අභියාචනා අවසන් වීමෙන් අනතුරුව එම ගොනු වලට අදාලව නඩු භාණ්ඩ නිලධාරියාගේ භාණ්ඩ ශේෂය තුල පවතින භාණ්ඩ පොත්වලින් ඉවත් කළ යුතු වීම. |
| (ii) | අල්ලස් පනතේ 30(අ)(3) වගන්තිය ප්‍රකාරව වැටලීම්වලට යොදාගන්නා මුදල් නෝට්ටු සඳහා සෑම විටම මුදල් අධිකරණයට ඉදිරිපත් නොකර මහේස්ත්‍රාත් අධිකරණයේදී මුදල් සහතිකයක් නිකුත් කරනු ලැබිය හැකි වුවද 2023 වර්ෂයේ නඩු භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව 2023 දෙසැම්බර් 31 දිනට රු.33,795,085 ක රජයේ මුදල් නඩු භාණ්ඩ නිලධාරියා භාරයේ පැවතුනි. | 2023 ජුනි 22 දිනැති කොමිෂන් සභා රැස්වීමේදී අධිකරණයේ එකඟතාවය මත හැකිතාක් දුරට එම මුදල් මුදාහැරීමට කටයුතු කරන ලෙස උපදෙස් ලැබුණු අතර ඒ අනුව ඉදිරියේදී කටයුතු කරන බව දන්වමි. | අල්ලස් පනතේ 30 (අ) (3) වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

## 2.3 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු පිළියෙල නොකිරීම හේතුවෙන් පුනරාවර්තන වැය විෂයයන් 10 ක හා මූලධන වැය විෂයයන් 02 ක ප්‍රතිපාදන ඉතිරිය රු.116,261,167 ක් වූ අතර එම ඉතිරිවීම් සියයට 25 සිට සියයට 100 දක්වා පරාසයක පැවතුණි. | මෙම ඉතිරිවීම් සම්බන්ධයෙන් පැහැදිලි කිරීම් 2023 මූල්‍ය ප්‍රකාශනයේ ඒසීඒ 2(11)හි දක්වා ඇත. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව සකසුරුවම්කම හා කාර්යක්ෂමතාවය පිළිබඳ නිසි සැලකිල්ලෙන් යුක්තව වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු විම. |

## 2.4 බැරකම් හා බැදීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2024 වර්ෂයේ ජනවාරි හා පෙබරවාරි මාසවල ගෙවීම් කළ සමාලෝචිත වර්ෂයට අදාළ එකතුව රු.1,057,391 ක්වූ වැය විෂයයන් 03 කට අදාල බැරකම් මු.රෙ.94(2) සහ (3) ප්‍රකාරව බැරකම්වලට එළඹෙන ලද බැදීම් ප්‍රකාශයේ ඇතුළත් කර නොතිබුණි. . | මෙම ගෙවීම් 2023 දෙසැම්බර් මාසයේ ජල, දුරකථන හා විදුලි බිල්පත් සඳහා වන ගෙවීම් වන අතර එම බිල්පත් 2023 ජනවාරි මස ලැබෙන බැවින් බැරකම් ප්‍රකාශයේ දක්වා නොමැත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම |

## 2.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| (අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | | | |
| (i) 4.2.1(ඇ) වගන්තිය | සමාලෝචිත වර්ෂයේ රු.790,395 කට මිලදීගෙන තිබූ වායුසමීකරණ යන්ත්‍ර | අදාල යන්ත්‍රයේ දෝෂය හටගෙන ඇත්තේ ප්‍රසම්පාදන සැලැස්ම සැකසීමෙන් පසුව වන | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කල යුතු |

| | | | |
|---|---|---|---|
| | මිලදී ගැනීම ප්‍රසම්පාදන සැලැස්මට ඇතුලත් කර නොතිබුණි. | බැවින් මෙම මිලදී ගැනීම ප්‍රසම්පාදන සැලැස්මට ඇතුලත් කිරීමට නොහැකි විය. | වීම. |
| (ii) 4.2.1(ඉ) වගන්තිය | ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම මාස 06 කට වැඩි නොවන කාලපරිච්ඡේදයක් තුලදී යාවත්කාලීන කර නොතිබුණි. | ඉදිරියේදී ප්‍රසම්පාදන සැලැස්මේ සිදුකලයුතු යාවත්කාලීන කිරීම් සිදුකරන ලෙස අදාල නිලධාරීන්ට උපදෙස් ලබා දෙන ලදි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කල යුතු වීම. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 සැලසුම් කිරීම**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 ජනවාරි 01 දින සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා කොමිෂන් සභාව වෙත පැමිණිලි 3431 ක් ලැබී තිබුණු අතර ඉන් පැමිණිලි 2789 ක් පැමිණිලි කමිටුව වෙත ඉදිරිපත් කර තිබුණි.පැමිණිලි කමිටුව වෙත ඉදිරිපත් කරන ලද පැමිණිලි වලින් ප්‍රමාණවත් කරුණු ඉදිරිපත් කර නොතිබීම සහ අල්ලස් පනතට අදාල නොවීම හේතුවෙන් තවදුරටත් කටයුතු නොකිරීමට නියෝග කරන ලද පැමිණිලි සංඛ්‍යාව 766 ක් වූ අතර කොමිෂන් සභා පනතට අදාල නොවීම හේතුවෙන් ඉදිරි කටයුතු සඳහා වෙනත් ආයතන වෙත ඉදිරිපත් කරන ලද පැමිණිලි සංඛ්‍යාව 613 ක් විය. ඒ අනුව පැමිණිලි කමිටුව වෙත ඉදිරිපත් කරන ලද පැමිණිලිවලින් සියයට 49 ක් කොමිෂන් සභා පනතට අදාළ පැමිණිලි හෝ ප්‍රමාණවත් කරුණු ඉදිරිපත් නොකරන ලද පැමිණිලි විය. | මහජනතාව කොමිෂන් සභාව වෙත ඉදිරිපත්කරන පැමිණිලි ප්‍රමාණය හා ස්වභාවය කොමිෂන් සභාවට පාලනය කල නොහැකිය. නමුත් ලැබෙන පැමිණිලි සියල්ල භාරගැනීමට කොමිෂන් සභාව බැඳී සිටී. එසේ වුවද ඉදිරි විමර්ශන කටයුතු සිදුකල හැක්කේ කොමිෂන් සභා පනතට අදාල පැමිණිළි සම්බන්ධයෙන් පමණක් බැවින් පනතට අදාල නොවන පැමිණිළි එම පැමිණිල්ලේ ස්වභාවය අනුව අදාල ආයතනය වෙත යොමුකිරීම සිදුකරණු ලැබේ. | අල්ලස් පනත සම්බන්ධයෙන් මහජනයා දැනුවත් කිරීම් තවදුරටත් වර්ධනය කළ යුතු වීම. |

## 3.2 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) පාඩු හා අත්හැරීම් තුල වර්ෂ 10 ට වැඩි රු.34,805 ක් හා වර්ෂ 5 ට අඩු රු.411,538 ක්වූ ශේෂ 02 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව පරීක්ෂණ පවත්වා අය කර ගැනීමට හෝ කපා හැරීමට කටයුතු කර නොතිබුණි. | 19-9522 රථයේ පාඩුව පොත්වලින් කපාහැරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට මහා භාණ්ඩාගාර ලේකම් වෙත යොමුකර ඇති අතර WP CAC 7026 රථයේ පාඩුව පොතෙන් නපා හැරීමේ කටයුතු අවසන් අදියරේ පවතී. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ආ) කොමිෂන් සභාවේ වාහන 04 කට සිදුව තිබූ අනතුරු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104(1) ප්‍රකාරව පරීක්ෂණ කටයුතුසිදුකර තිබුණේවාහන අනතුර සිදුවී මාස 07 සිට වසර 06 ක කාලයක් ගතවීමෙන් පසුව විය. | ප්‍රවාහන නිලධාරීන් ස්ථාන මාරුවීම නිසා 301-9385 රථයට අදාල කටයුතුවල ප්‍රමාධයක් සිදුවී ඇති නමුත් අනිකුත් වාහන සම්බන්ධ මු.රෙ. 104 ප්‍රකාර විමර්ශන කටයුතු සාමාන්‍ය කාල සීමාව තුල සිදුකර ඇත. මෙවැනි ප්‍රමාදයන් සිදු නොවන ලෙස කටයුතු කරනලෙස අදාල නිලධාරීන්ට උපදෙස් ලබා දෙන ලදි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

## 3.3 කළමනාකරණ දුර්වලතා

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2006 ජනවාරි 31 දිනට නඩු භාණ්ඩ අපහරණය කිරීම පිළිබඳව පත්කර තිබූ කමිටුව මඟින් ගොනු 10 කට අදාල නඩු භාණ්ඩ අයිතම 36 ක් වෙන්දේසියට යොමු කිරීමට නිර්දේශ කර තිබුණු අතර එම නිර්දේශ ලබා දී වසර 18 ක් ගත වී තිබුණද සමාලෝචිත වර්ෂය දක්වාම මෙම නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. | මේ දක්වා නඩු අවසන් වී භාරදී නොමැති සියලු නඩු භාණ්ඩ ලැයිස්තුවක් පිළියෙල කර ඇත. අපහරණ කමිටුවක් පත් කර මෙම භාණ්ඩ අපහරණය කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බව කාරුණිකව දන්වමි. | 2006 ජනවාරි 31 දිනට නඩු භාණ්ඩ අපහරණ කමිටුවේ නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු වීම. |

## 4. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩල තොරතුරු අනුව 2023 දෙසැම්බර් 31 දිනට ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 38 ක්ද, තෘතීය මට්ටමේ පුරප්පාඩු 204 ක්ද, ද්විතියික මට්ටමේ පුරප්පාඩු 189 ක්ද හා ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 60 ක්ද පැවතුණි. | මෙම පුරප්පාඩු පවතින නමුත් රජයේ සේවයේ බඳවා ගැනීම් නවතා ඇති බැවින් බඳවා ගැනීම් සිදුකිරීමට නොහැකි වී ඇත. නමුත් සහකාර අධ්‍යක්ෂ (නීති) තනතුරු 16 ක්, යතුරු ලේඛක සේවයේ පුරප්පාඩු හා කාර්යාල සේවක සෙවයේ පුරප්පාඩු 10 ක් (බහු කර්යය නිලධාරීන් මගින්) පිරවීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අවසරය ලබා ගෙන ඇති අතර අනිකුත් බඳවා ගැනීම් පසුව සමාලෝචනය කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. ඒ අනුව කාර්යාල කාර්ය සහායක බඳවා ගැනීම් මේවන විට සිදුකර ඇති අතර සහකාර අධ්‍යක්‍ෂ (නීති) තනතුරු සඳහා බඳවා ගැනීමේ සම්මුඛ පරීක්‍ෂණ පවත්වා එම ප්‍රතිඵල අනුමැතිය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමුකර ඇත. | කාර්යසාධනයට අහිතකර ලෙස බලපාන අත්‍යවශ්‍ය තනතුරුවල පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | කොමිෂන් සභාව විසින් 2018 වර්ෂයේදී විමර්ශන නිලධාරී තනතුරු 200 ක්ද, 2019 වර්ෂයේදී සහකාර අධ්‍යක්ෂ (නීති) නිලධාරී තනතුරු 30 ක් හා දූෂණ නිවාරණ නිලධාරී තනතුරු 50 ක්ද කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කරවාගෙන තිබුණද 2023 දෙසැම්බර් 31 දිනට එම තනතුරුවල පිළිවෙලින් විමර්ශන නිලධාරී තනතුරු 200 ක්ද, සහකාර අධ්‍යක්ෂ (නීති) නිලධාරී තනතුරු 20 ක්ද හා දූෂණ | මෙම පුරප්පාඩු පවතින නමුත් රජයේ සේවයේ බඳවා ගැනීම් නවතා ඇති බැවින් බඳවා ගැනීම් සිදුකිරීමට නොහැකි වී ඇත. නමුත් සහකාර අධ්‍යක්ෂ (නීති) තනතුරු 16 ක්, යතුරු ලේඛක සේවයේ පුරප්පාඩු හා කාර්යාල සේවක සෙවයේ පුරප්පාඩු 10 ක් (බහු කාර්යය නිලධාරීන් මගින්) පිරවීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අවසරය ලබාගෙන ඇති අතර අනිකුත් බඳවාගැනීම් පසුව සමාලෝචනය කිරීමට කටයුතු කරන බව දන්වා | කාර්යසාධනයට අහිතකර ලෙස බලපාන අත්‍යවශ්‍ය තනතුරුවල පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතු වීම. |

නිවාරණ නිලධාරී තනතුරු 36 ක් පුරප්පාඩුව පැවතීම ආයතනයේ කාර්යසාධනයට අහිතකර ලෙස බල නොපාන බව විගණනයේදී බැහැර කල නොහැක.

ඇත. ඒ අනුව කාර්යාල කාර්ය සහායක බඳවා ගැනීම් මේවන විට සිදුකර ඇති අතර සහකාර අධ්‍යක්ෂ (නීති) තනතුරු සඳහා බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණ පවත්වා එම ප්‍රතිඵල අනුමැතිය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමුකර ඇත.